**හෝමියෝපති වෛද්‍ය සභාව - 2017**

---

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 40(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI -1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම්වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට හෝමියෝපති වෛද්‍ය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීමට සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවත් ඊට අනුකූල නොවන ලෙස සභාව විසින් වත්කම් මිලදී ගත් දිනය නොසලකා එම මිලදී ගත් වර්ෂය සඳහා සම්පූර්ණයෙන්ම ක්ෂය කිරීම හා ඉවත් කරන වර්ෂයේදී ක්ෂය නොකිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 8

ප්‍රමිතයේ 100 ඡේදය ප්‍රකාරව, සභාවට එරෙහිව පවතින නඩු 5 ක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඖෂධ ඇසිරීම සඳහා මිලදී ගනු ලබන ඖෂධ බහාලුම් ඩප්පි හා කවර සඳහා දරනු ලබන පිරිවැය මිලදී ගනු ලබන වර්ෂයේදීම වියදමක් ලෙස කපා හැරීම සිදුකර තිබුණි. එබැවින් ඉකුත් වර්ෂයේදී මිලදීගෙන සමාලෝචිත වර්ෂය තුලදී පාරිභෝජනය කරන ලද පිරිවැය රු.233,000 ක්වූ ඖෂධ බහාලුම් හා ඩප්පි වර්ෂයේ වියදමක් ලෙස සටහන් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. එසේම 2017 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.685,300 ක්වූ ඉතිරි තොගය ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ජංගම වත්කම්ද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සේවකයින් 19 දෙනෙකුගේ සම්පූර්ණ සේවා කාලය වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට සැලසිය යුතු පාරිතෝෂික ප්‍රතිපාදනය රු.840,650 ක් වුවද ඒ වෙනුවට රු.497,614 ක් ප්‍රතිපාදනය කර තිබීම හේතුවෙන් පාරිතෝෂික ප්‍රතිපාදනය රු.343,036 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඇ) විභාග ගාස්තු වශයෙන් 2014 වර්ෂයේදී සභාව වෙත ලැබී තිබුණු රු.195,900 ක් සභාව නමින් වූ ජංගම ගිණුමට බැර නොකර සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් නමින් පවත්වා තිබුණු ජංගම ගිණුමකට බැර කර තිබුණි. ඒ අනුව එම ආදායම රජයේ ආදායමට බැරවී තිබුණු බැවින් තවදුරටත් එය සභාවේ වත්කමක් නොවන නමුත් එම වටිනාකම වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාලය සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන අතර එම ගොඩනැගිල්ල සහ භූමියේ හිමිකම එම සභාව සතුව නොතිබුණු නමුත්, 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී එම ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම වෙනුවෙන් වැයකර තිබුණු රු.4,227,506 ක් ජංගම නොවන වත්කම් යටතේ ප්‍රාග්ධන ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදීගෙන තිබුණු පිරිවැය රු.259,990 ක් වූ නාම පුවරු 7 ක ක්ෂය රු.31,199 ක් ගිණුම්ගත කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.430,427 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.422,515 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,912 ක අඩුවීමක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන රු.1,189,976 කින් හා මුළු වියදම් රු.1,209,301 කින් වැඩිවීම ඉහත සඳහන් අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 හා 2014 වර්ෂවල පිළිවෙලින් රු.111,977 ක් හා රු.170,636 ක් වූ ඌනතාවය 2015 වර්ෂයේදී රු.271,598 ක අතිරික්තයක් වී තිබුණු අතර 2016 හා 2017 වර්ෂවල නැවතත් පිළිවෙලින් රු.422,515 ක හා රු.430,427 ක ඌනතාවයන් ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.4,873,487ක් වූ දායකත්වය 2015 වර්ෂයේදී රු.9,951,274 ක් දක්වා එනම් සියයට 6 සිට සියයට 93 අතර උච්චාවචනයක් සහිතව වර්ධනය වී තිබුණු අතර 2016 හා 2017 වර්ෂවලදී පිළිවෙලින් රු.10,015,998 ක් හා රු.11,662,324 ක් දක්වා වර්ධනය වී තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව ඇති නෛතික සිද්ධි

-----------------------------------------------

වෛද්‍ය සභාවේ සේවය කළ වෛද්‍යවරයෙකු හා කම්කරුවෙකු සේවයෙන් ඉවත් කිරීමට එරෙහිව පිළිවෙලින් රු.මිලියන 3 ක් හා රු.මිලියන 2 බැගින් වන්දි ඉල්ලා නඩු පවරා තිබුණි. ඊට අමතරව, හිඟ වැටුප් ගෙවීම හා වෛද්‍ය සභාව විසුරුවා හැරීමෙන් පසු සිදුකළ පත්කිරීම් හා ලියාපදිංචි කිරීම් බල රහිත කරන ලෙස ඉල්ලා වෛද්‍යවරු දෙදෙනෙකු විසින් සභාවට එරෙහිව නඩු 2 ක් පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

හෝමියෝපති වෛද්‍ය වෘත්තියෙහි යෙදීම ප්‍රවර්ධනය, අභිවර්ධනය කිරීම හා නියාමනය කිරීම, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ පර්යේෂණ කිරීම හා ප්‍රවර්ධනය කිරීම, ඖෂධ වර්ග සහ වෙනත් පිළියෙල කිරීම් නිෂ්පාදනය, විකිණීම හා බෙදාහැරීම නියාමනය කිරීම හා පාලනය කිරීම යන ප්‍රධාන අරමුණු ඉටුකරගැනීමට අදාළ සැලසුම් ඇතුළත් කර සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙලකර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

2016 අංක 10 දරන හෝමියෝපති පනත ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය තුළදී සභාවේ අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව සිදුකරන ලද පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 30 වගන්තිය ප්‍රකාරව, හෝමියෝපති වෛද්‍යවරු ලියාපදිංචිය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට 2016 නොවැම්බර් 04 දින පැවති අතුරු වෛද්‍ය සභා රැස්වීමේදී තීරණයකර තිබුණද 2018 මැයි 31 දිනවන විටත් ඒ සඳහා අවශ්‍ය නීති සම්පාදනය කර නොතිබුණි.

(ආ) සභාව විසින් පවත්වන සායන 7 න් සායන 4 ක් සඳහා රෝගීන්ගේ සහභාගීත්වය අඩුවී තිබුණු අතර එම අඩුවීම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 4 සිට සියයට 25 දක්වා පරාසයක විය. සායන 3 ක රෝගී සහභාගීත්වය වැඩිවී තිබුණු අතර එම වැඩිවීම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 6 සිට සියයට 20 දක්වා විය.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙලකර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතුකර නොතිබුණු අවස්ථා පහත පරිදි විය.

(i) පනතේ විධිවිධාන යටතේ හෝමියෝපති සෞඛ්‍ය සේවා සපයන ආයතන ලියාපදිංචි කිරීම හා රජයේ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීමට අවශ්‍ය රෙගුලාසි ප්‍රකාශයට පත්කිරීම යන අරමුණු ඉටුකරගැනීමට කටයුතුකර නොතිබුණි. තවද, හෝමියෝපති පනතේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී නීති රීති හා රෙගුලාසි ප්‍රකාශයට පත්කර පාර්ලිමේන්තුවේ සම්මත කරගැනීමට සැලසුම්කර තිබුණද නියෝග හා රීතීන් 3ක් කෙටුම්පත් කිරීම පමණක් සිදුකර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී විභාගයක් පවත්වා හෝමියෝපති වෛද්‍යවරු ලියාපදිංචි කිරීමට සැලසුම්කර විභාගය පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවා තිබුණු නමුත් විභාගය පවත්වා නොතිබුණු අතර වෛද්‍යවරු ලියාපදිංචි කිරීමද සිදුකර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළදී හෝමියෝපති ඖෂධ ආනයනය කර බෙදාහැරීමට සැලසුම්කර තිබුණද ඖෂධ ආනයනය කිරීමේ ඉල්ලුම්පත් 7 කට අනුමැතිය ලබාදීම පමණක් සිදුකර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේදී පැවති අතුරු වෛද්‍ය සභාව විසින් පැවැත්වීමට සැලසුම්කර තිබුණු පාඨමාලාවක් සඳහා ගාස්තු ලෙස අයකර ගත් මුදල් පෞද්ගලික බැංකුවක තැන්පත්කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම ගිණුමෙහි ශේෂය රු.1,702,684 ක් විය. සැලසුම් කළ පරිදි අදාළ පාඨමාලාව පවත්වා නොතිබුණු අතර එම මුදල් තැන්පත්කරුවන් වෙත ආපසු ගෙවිය යුතු බවට අතුරු වෛද්‍ය සභාව තීරණයකර තිබුණද තැන්පත්කරුවන් පිළිබඳ තොරතුරු හා අයකර ගත් මුදල කොපමණද යන්න පිළිබඳ තොරතුරු කිසිවක් සභාව සතුව නොතිබුණි.

(ආ) 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 51(2) වගන්තිය ප්‍රකාරව, අමාත්‍යවරයා විසින් පත්කරන ලද අතුරු වෛද්‍ය සභාව මෙම පනත ක්‍රියාත්මක දිනයේ සිට වර්ෂ දෙකක් තුළ සභාව පිහිටුවන තුරු සභාවේ කාර්යයන් ඉටු කරනු ලැබිය යුතුය. එහෙත් පනතේ 51(3) වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් අතුරු වෛද්‍ය සභාව පත්කරනු ලැබිය යුතු වන්නේ නියමිත දිනයෙන් ආරම්භවන මාස තුනක කාලයක් සඳහාය. ඒ අනුව අතුරු වෛද්‍ය සභාවේ වලංගු කාලය පිළිබඳ පනතේ එක් එක් වගන්තිවල නොසැසඳීම් නිවැරදි කර ගැනීමට කළමනාකාරීත්වය පියවර ගෙන නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණු අතර 2016 වර්ෂයේදී ලියාපදිංචි වී තිබුණු වෛද්‍යවරුන් 8 දෙනෙකුගේ නම් ගැසට් පත්‍රය මගින් නිවේදනයකර නොතිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

මහජන අරමුදල් රැස්කිරීම සඳහා බලයක් ලැබෙන කිසිදු ප්‍රතිපාදනයක් නොමැතිව හා විධිමත් අනුමැතියක් නොමැතිව "හෝමියෝපති අරමුදල" නමින් එකක් රු.50 ක වටිනාකමක් සහිත ආධාර පත්‍ර 100 ක් අඩංගු ආධාර පත්‍ර පොත් මුද්‍රණයකර තිබුණු අතර මුද්‍රණය කළ මුළු ආධාර පත්‍ර සංඛ්‍යාව, මුද්‍රණය කළ වර්ෂය, ආධාර පත්‍ර අලෙවි ආදායම හා එම මුදල් බැංකුගත කිරීම පිළිබඳ තොරතුරු කිසිවක් සභාව සතුව නොතිබුණි. 2018 අප්‍රේල් 26 දින වන විට ඉන් පොත් 417 ක තොගයක් ඉතිරිව පැවතුණි. පැවති පහළම පොත් අංකය හා ඉහළම පොත් අංකය අතර පොත් 162 ක හිඟයක් පැවති අතර එමගින් රැස්කළ හැකිව තිබුණු මුළු මුදල රු.810,000 ක් විය.

## 4.5 නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ලී බඩු හා උපකරණ සපයාගෙන තිබුණද, එහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව පිළියෙල කිරීමට පියවර ගෙන නොතිබීම හේතුවෙන් 2018 මැයි 31 දින වන විටත් අධ්‍යයන කටයුතු ආරම්භකර නොතිබුණි. ඒ අනුව මිලදී ගෙන තිබුණු පිරිවැය රු.1,199,254 ක් වූ ස්ථාවර වත්කම් හා ඊට අදාළ ගොඩනැගිල්ල වර්ෂ 07 ට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුනි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1970 අංක 07 දරන හෝමියෝපති පනතේ 20(2) හා 20(3) වගන්ති ප්‍රකාරව, භාණ්ඩාගාර ලේකම්ගේ හා සභාවේ කැමැත්ත පරිදි අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු තාවකාලික වශයෙන් සභාවේ ලේඛකාධිකාරී තනතුරට පත්කළ යුතු වුවත්, අතුරු පාලක සභාව විසින් අමාත්‍යාංශයෙන් පරිබාහිර තැනැත්තෙකු වර්ෂ 3 ක පරිවාස කාලයකට යටත්ව 2012 ඔක්තෝබර් 16 දින ලේඛකාධිකාරී තනතුර සඳහා ස්ථිර පදනමින් බඳවා ගෙන තිබුණි.

(ආ) ඖෂධ සංයෝජකවරුන් සඳහා අනුමත බඳවාගැනීම් පරිපාටියේ 4.4 ඡේදය ප්‍රකාරව, සේවයෙහි ස්ථිර කිරීම සඳහා තනතුරට පත්කර වර්ෂ 3 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතු වුවද 2014 ඔක්තෝබර් 24 දින සිට ස්ථිර පදනමින් බඳවා ගෙන තිබුණු ඖෂධ සංයෝජකවරුන් 07 දෙනෙකු සේවයෙහි ස්ථිර කිරීම සඳහා අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීමට 2017 දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

## 5. තිරසර සංවර්ධනය

### 5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව වෛද්‍ය සභාව විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව, සභාව සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණු අතර සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් හෝ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 6.2 අයවැය ලේඛනමය පාලනය

2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 වගන්තිය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ආදායම් හා වියදම් සම්බන්ධ ඇස්තමේන්තුගත අයවැය ලේඛනයක් පිළියෙලකර එය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගැනීමට කටයුතුකර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදි. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි කළමනාකාරීත්වයේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | සියලුම වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ඇතුළත්ව ලෙජර් ගිණුම් පවත්වාගෙන ගොස් නොතිබීම හා ගැලපීම් සඳහා ජර්නල් සටහන් ලියා නොතිබීම. |
| (ආ) පාරිභෝජන ද්‍රව්‍ය තොග පාලනය | ඖෂධ බහාලුම් ඩප්පි හා කවර තොග භෞතික සමීක්ෂණයට ලක්කර නොතිබීම හා එම තොග පිළිබඳ නිවැරදි ගිණුම් තැබීමක් සිදුකර නොතිබීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | අනුමත බඳවාගැනීම් පරිපාටි හා රෙගුලාසි අනුව හෝමියෝපති වෛද්‍ය විෂයානුගත කාර්ය මණ්ඩලය සඳහා බඳවාගැනීම් සිදුනොකිරීම. |